# මූල බ්‍රාහ්මී ශිලාලේඛනවලින් හෙළිවන තත් යුගයේ ශ්‍රී ලාංකේය ආර්ථික තත්ත්වය

ගල්වැවේ විමලඛන්ති හිමි

## හැඳින්වීම

ක්‍රිස්තු පූර්ව තෙවන සියවසේ සිට ක්‍රිස්තු වර්ෂ පළමු සියවසේ මැද භාගය දක්වා යුගයේ ශ්‍රී ලංකාවෙහි සටහන් කොට ඇති ශිලාලේඛන ආශ්‍රිත යුගය ''මූල බ්‍රාහ්මී යුගය'' වශයෙන් සාමාන්‍යයෙන් පිළිගැනේ. තත් යුගයේ ආර්ථික තත්ත්වය ශිලාලේඛන ආශ්‍රයෙන් විවරණය වන්නේ කෙලෙසකදැ යි විමර්ශනය කිරීම මේ ලිපියේ අරමුණ යි. මේ යුගයේ ශිලාලේඛනවල ආර්ථික තත්ත්වය පිළිබඳව දක්නට ලැබෙන තොරතුරු බෙහෙවින් හීන ය. එහෙත් ඒවාහි සඳහන් කරුණු ආශ්‍රයෙන් තත් යුගයේ ආර්ථික තත්ත්වය එම තොරතුරුවලින් පීරාගෙන ඉදිරිපත් කිරීමත්, ඒවා විමර්ශනය කිරීමත්, මෙහිදී සිදු කොට තිබේ.

## අරමුණ

මෙම ලිපියේ අරමුණ මූල බ්‍රාහ්මී ශිලාලේඛන ආශ්‍රයෙන් තත් යුගයේ ශ්‍රී ලංකාවේ ආර්ථික තත්ත්වය විමර්ශනය කිරීම යි. ලෙන් කටාරම්තුළ දක්නට ලැබෙන කෙටි ලිපිවර්ගයක් වන ලෙන් ලිපි මේ යුගයට ප්‍රධාන වශයෙන් අයත් වේ. දැනට හමුවී ඇති තත් මූල බ්‍රාහ්මී සියලු ම ලිපි ආශ්‍රය කරගෙන එම යුගයේ ආර්ථික තත්ත්වය හඳුනා ගැනීම මේ ලිපියේ ප්‍රධාන අරමුණ යි.

## පර්යේෂණ ක්‍රමවේදය

පර්යේෂණ ක්‍රමවේදය වශයෙන් ප්‍රධාන වශයෙන් යොදාග නු ලබන්නේ දැනට ප්‍රකාශයට පත්ව ඇති මූල බ්‍රාහ්මී ශිලාලේඛන යි. තව ද අප්‍රකාශිත නවීනව සොයාගෙන ඇති එම යුගයට අයත් ශිලාලේඛන ද භාවිතයෙන් මේ පර්යේෂණය සිදු කරනු ලැබේ. ඒ අනුව ග්‍රන්ථ සන්ධාර පර්යේෂණ ක්‍රමවේදය හා ක්ෂේත්‍ර පර්යේෂණ

ක්‍රමවේදය යන අංශද්වය ම මෙහිදී පර්යේෂණ ක්‍රමවේදය වශයෙන් භවිතයට ගැනේ.

**සාකච්ඡාව**

මූල බ්‍රාහ්මී යුගයේ ආර්ථික තත්ත්වය විමර්ශනය කිරීමට තත් යුගයට අදාළ ශිලා ලේඛනවලින් ලැබෙන පිටුවහල බෙහෙවින් අල්ප ය. මහාචූලික මහාතිස්ස රාජ්‍ය සමයේ සිට (ක්‍රි.පූ.77-63) ලැබෙන ශිලාලේඛනවලින් ආර්ථික තත්ත්වය විමර්ශනය කිරීමට ප්‍රමාණවත් කරුණු අන්තර්ගත වේ. එහෙත් මූල බ්‍රාහ්මී යුගය වසභ රාජෝ‍යාදය (ක්‍රි.ව.67) දක්වා පැවතිය ද ලෙන්ලිපි ආශ්‍රිත ශිලාලේඛන මෙහිදී ප්‍රධාන වශයෙන් භාවිතයට ගනු ලබන බැවින් ගිරිලිපි ආශ්‍රිතව ලැබෙන තොරතුරු අපර බ්‍රාහ්මී යුගයේ ශිලා ලේඛනගත තොරතුරු හා විවරණය වේ. ශිලා ලේඛනවල ස්වභාවය පිළිබඳ විමර්ශනය කිරීමේ දී පැහැදිලි වන්නේ ශිලා ලිපි ආශ්‍රිත තොරතුරු වෙන ම කුලකයක් සේ විවරණය කිරීම සාධාරණ බව යි. එබැවින් වැඩි වශයෙන් සෙල්ලිපි ආශ්‍රිත තොරතුරු ආශ්‍රයෙන් පමණක් මෙම යුගයේ ආර්ථික තත්ත්වය විවරණය කිරීම සිදු කරනු ලැබේ. ලක්ෂ්මන් එස්. පෙරේරා ද පවසන්නේ වැව්, ඉඩම්, ගම්මාන හා ජල මාර්ග ආදිය විහාරස්ථාන හා භික්ෂූන් වෙත පරිත්‍යාග කිරීම මහාචූලික මහාතිස්ස රාජ්‍ය සමයෙන් පසු ආරම්භ වන බව යි. (Perera L.S., 2001:60) එහෙත් එම තොරතුරු වැඩි වශයෙන් ශිලා ලේඛනවල වස්තු විෂය ලෙස දැක්වෙන අපර බ්‍රාහ්මී යුගයේ ම රචිත ශිලාලේඛන හා එකී තොරතුරු සාකච්ඡා කිරීම වඩාත් උචිත බව එතුමා ද පිළිගනියි. (ibid) කෙසේ වෙතත් ඇතැම් ශිලාලේඛනවල මෙම යුගයේ එකී ශිලාලේඛන පිහිට වූ අයගේ රැකියා පිළිබඳ පුවත් සටහන් වේ. එම තනතුරු මෙම යුගයේ ආර්ථික තත්ත්වය පිළිබඳව පිළිබඳ විමර්ශනයේ දී යම් පමණකට සාධක වශයෙන් භාවිත කළ හැකිය.

මෙම යුගයේ ආර්ථික තත්ත්වය විමර්ශනය කිරීමේදී ප්‍රධාන ජීවනෝපාය ලෙස කෘෂිකර්මාන්තය හඳුනාගත හැකිය. ඒ සඳහා එම යුගයට අයත් ලෙස සැලකිය හැකි අටුවා කථාවල එන පුවත් ද භාවිත කළ හැකිය. ඊට අමතරව වංශකතාවල පෙනෙන ආර්ථික පුවත් හා ජීවනෝපාය මාර්ගයන් ද මෙහිදී විමර්ශනයට බඳුන් කළ හැකි වේ.

එහෙත් ලෙන් ලිපි ආශ්‍රිත තොරතුරුවලින් යම් පමණකට ආර්ථික රටාව පිළිබඳව තොරතුරු සමහරක් පිරා ගත හැකි ය.

මෙම යුගයට අයත් ඇතැම් ශිලාලේඛනයන්හි වෙළෙඳශ්‍රේණීන් පිළිබඳව සඳහන් වේ. පොළොන්නරු දිස්ත්‍රික්කයට අයත් කුරුණෑකල්ලු නම් ස්ථානයෙන් සොයා ගත් ශිලාලේඛනයකට අනුව ''පුකියන'' යන වදන හමුවේ. (Paranavitana,S.,1970:25) මෙහි සුකියන වශයෙන් යෙදුණු වචනය පරණවිතාන සමාගම (Corpartion) වශයෙන් පරිවර්තනය කරයි. (ibid) එහෙත් පුක/පුග යන වදන් සඳහා ශ්‍රේණිය හෙවත් ගණය යන අර්ථය ද යෙදේ. පුකන, පුගියන, පුකියන, පුග යන වදන් මෙම යුගයේ ශිලාලේඛනවල අන්තර්ගත වෙයි. ඉහත දැක්වූ කුරුණෑකල්ලු ශිලා ලේඛනයේ ''දිපිකුලිකන පුකියන'' යන වදන් හමුවේ. එයින් දිපිකුලිකන නම් සමාගම යන අර්ථය ලැබේ. දිපිකුලිකන නමින් සමාගමක් පැවති බව එයින් සනාථ වේ. මේ හැර අනුරාධපුර අවුකනින් හමු වූ ශිලාලිපියක ''පුකන ලෙන'' වශයෙන් යෙදී තිබේ. (Paranavitana,S.,1970:25)

මෙහි සඳහන් වන ආකාරයට පඩගමෙහි පිහිටි සමාගමෙහි ජ්‍යෙෂ්ඨයා විසින් බදු තුනක් ලෙන සඳහා පරිත්‍යාග කළ බව කියැවෙයි. (ibid) මෙහි ද සමාගමක් පිළිබඳව කියැවේ. ගණේකන්දවිහාර ශිලාලේඛනයකින් මීටත් වඩා විස්තර සහිත සමාගමක් පිළිබඳව කරුණු සටහන් වේ. එහි දැක්වෙන ආකාරයට ''සිදවිය'' නම් සමාග මෙහි සාමාජිකයින් විසින් ලෙනක් කරවා පුදා ඇත. (ibid:96) ඒ අනුව ශිල්පාචාරි තිස්ස එහි ප්‍රධානියා වන අතර උප ප්‍රධානියා වූයේ නාග යි. (ibid) කෙසේ වෙතත් විවිධ කාර්ය කර්තව්‍යයන්හි යෙදී සිටි පිරිස් ආශ්‍රිත සමාගම් ක්‍රියාත්මකව පැවති බව මෙයින් පසක් වේ. පුග හෝ පුගියන යන වදන් යෙදුණු ශිලාලේඛන අඩුම තරමින් දහයක් (10) මෙම යුගයට අයත්ව හමුවෙයි. අනුරාධපුර දිස්ත්‍රික්කයට අයත් මහාකපුගොල්ලෑව ලෙන් ලිපියක ''තබුඩ'' පවුලට අයත් සමාගමක් විසින් කළ ලෙන් පූජාවක් ගැන කියවේ. (Paranavitana,S.,1970:25) එසේ ම අනුරාධපුර දිස්ත්‍රික්කයේ අලියාකඩින් හමු වූ ශිලා ලේඛනයක අලපවත නම් ස්ථානයක වූ සමාගමක් විසින් ලෙනක් පූජා කොට තිබේ. (ibid) ඒ අනුව සමාගම් විසින් ලෙන් ආරාම සකස් කොට පූජා කොට ඇති ආකාරය මනාව ප්‍රකට වේ. බෝවත්තේගලින් ලද ශිලා

ලේඛනයකට අනුව කාබොජි නම් වූ ප්‍රධාන සමාගමෙන් (මහපුගියන) ලෙන් පූජාවක් කළ බව සටහන් වේ. (ibid:42)මෙහි ''කබොජි'' යනු කාම්බෝජවාසීන් විය හැකි ය. එසේ ගත් විට කාම්බෝජය හා පැවති සබඳතා මෙන් ම මෙකී සමාගම අන්තර්ජාතික වෙළෙඳ සමාගමක් වශයෙන් අර්ථ විවරණය කිරීමට ද අවකාශ හිමි වේ. දකුණු කාශ්මීරයත් සමග පැවැති වාණිජ සබඳතාවයන් පිළිබඳව එම වදනින් අර්ථවත් වන්නේයැ යි පරණවිතාන කල්පනා කරයි. (Paranavitana,S.,1970: xci) හම්බන්තොට ගෝණගලින් ''මධුකශලිය'' නම් සමාගමක් පිළිබඳව ද හම්බන්තොට වෙහෙරකෙමින් ''තනවය'' නම් සමාගමක් පිළිබඳව ද වැලඑල්ලුගොඩකන්ද නම් ස්ථානයෙන් සමාගමක් විසින් කළ ලෙණක් ද මොණරාගල මඩුගස්මුල්ල ශිලාලේඛනයකින් පචගන නම් ජ්‍යොෂ්ඨයාට අයත් සමාගමක් විසින් කරවා පිදූ ලෙණක් පිළිබඳව ද කරුණු සටහන් වී ඇත. (Paranavitana,S.,1970:662, 696, 726, 1182) තව ද දිඹුලාගල දකුණු කඳු බෑවුමේ කුඩාගලින් හමු වූ ලෙන් ලිපියක සමාගමක් විසින් පිදූ ලෙණක් හමුවේ. (Dias,M.,1991(03) තව ද මොණරාගල බුදුගල්ලෙන නම් ආරණ්‍ය සේනාසනයෙන් හමු වූ සමාගම් දෙකක් විසින් කළ ලෙන් පිදීම් දෙකක්, එල්ලාවල මේධානන්ද හිමියන් විසින් වාර්තා කරනු ලැබ තිබේ. (මේධානන්ද හිමි,එ.,1999:44) යම් යම් සමාගම් හා වෙළඳ සමාගම් ලෙස අර්ථ නිරූපණය කළ හැකි සමාගම් විසින් මෙම යුගයේ ලෙන් පිදීම සිදු කොට තිබෙන බව සනාථ වේ. තව ද මෙම යුගයේ පැවති උළු ගඩොල් වෙළඳාම් කළ වෙළෙඳ නගරයක් පිළිබඳව සඳහනක් කොන්ග්‍රායන්කුලම් ගිරි ලිපියෙන් ලැබේ. එම වෙළඳ නගරයේ විකිණීමට උළු හා ගඩොල් පැවති බව එම ශිලා ලේඛනයේ පැහැදිලිව සටහන් වී තිබේ. (විමලබන්ති හිමි ජී., 2018:18) මෙලෙස මෙම යුගයේ විවිධ සමාගම් පැවති බවට සාධක ලෙන් ලිපි ආශ්‍රයෙන් හමුවේ. එය ආර්ථිකයේ එක් ප්‍රධාන කොට්ඨාශයක් නියෝජනය කරන්නට ඇති බව පැහැදිලිය. මෙකී සමාගම් ජාතික හා ජාත්‍යන්තර වෙළඳාමෙහි යෙදී සිටි පිරිස් බව ද උපකල්පනය කළ හැකිය. කොන්ග්‍රායන්කුලම් වෙළෙඳ නගරයේ මහානාග නමින් ගණකයෙක් වාසය කොට තිබේ. ඒ එම වෙළෙඳ නගරයේ ප්‍රධාන ගණකාධිකාරීවරයා ය (විමලබන්ති හිමි, ජී. 2018:19) මේ නිසා වෙළෙඳාම හා සමාගම් පිළිබඳව පෙණෙන තොරතුරු තත් යුගයේ ආර්ථික රටාවෙහි එක් අංශයක් පිළිබඳව වැදගත් කරුණු හෙළි කරයි.

එහෙත් මේ පිළිබඳව ලක්ෂ්මන් එස්. පෙරේරා දක්වන්නේ ගණන්, රැකියාව, කුලී වැඩ, මුදල්, ආහාර, ප්‍රවාහනය, ආර්ථිකය වැනි කරුණු සම්බන්ධයෙන් හිස්තැනක් ශිලා ලේඛන ආශ්‍රයෙන් ප්‍රදර්ශනය වන බවයි. (Perera L.S.,2001:61)

ආර්ථිකය සම්බන්ධයෙන් විමසීමේදී ''ගම'' ප්‍රධාන ඒකකය (Unit) වෙයි. ගම පාලනය වූ ආකාරය පිළිබඳව ඍජු සාධක නොවුන ද ගමණි, ගමික වැනි ගම්වල ප්‍රධානීන් සම්බන්ධව වදන් මෙම යුගයේ ශිලාලේඛන ආශ්‍රයෙන් හමුවේ. මෙම යුගයට අයත් ශිලා ලේඛනවලින් හතළිස් තුනක් (43) ''ගමණි'' යන තනතුර සහිත නිලධාරීන් පිළිබඳව සටහන්ව තිබේ. මෙහිදී විවිධ නිලධාරීන් පිළිබඳව විමසීමේදී ගමණි  යන නාමය සහිත මහරජවරු ද සිටි බැවින් ඔවුන් ද ගාමිණී හෙවත් ගම් ප්‍රධානීන් පිළිබඳව කියැවෙන වදන් හා සමවන බැවින් මෙහිදී වඩාත් සැලකිලිමත් විය යුතු වේ. ගාමණී යන්න පාලක තනතුරක තත්වත්වයෙහිලා උසස් කොට සලකනු ලැබූ බව සී. ඩබ්ලිව්. නිකොලොස් කියයි. (ලංකා ඉතිහාසය,1967:144) ඍග්වේද සාහිත්‍යයාගත කරුණු අනුව ''ගමණි'' යනු තැනින් තැනට යන එඬේර ජීවිතයක් ගත කළ රංචුවක ප්‍රධානියාට ද භාවිත කළ හැකි වදනකි. මෙම ගමණි ම පසුකාලයේ ගමක හෝ රටක ප්‍රධානියා වශයෙන් සලකන්නට ඇත. වෛදික යුගයේ ඉතා බලසම්පන්න ගෝත්‍රිකයන්ගෙන් එක් ගෝත්‍රිකයෙකුට අයත් භාරකරුවන් ''ග්‍රාමණී'' යන වදනින් හඳුන්වා ඇති බව ඊ.ජේ. රැප්සන් පවසයි. (Rapson,E.J.,1992:95) කෙසේ වෙතත් ගමෙහි ආර්ථිකය පිළිබඳව විමසීමේ දී ''ගමික'' හෝ ''ගාමණීන්'' සතුව පැවති ආර්ථික ශක්තිය ප්‍රබල සාධකයක් වූ බව සිතිය හැකිය. මෙහිදි ''ගමණි'' යන වදන සහිත ශිලා ලේඛනවලින් දහයක් (10) ''දෙවනපිය මහරජ ගමණි අබය'' වශයෙන් යෙදී ඇත. එහිදී එම ශිලා ලේඛන කුරුණෑගල දිස්ත්‍රික්කයේ ඇන්නරුව නම් ආරාම සංකීර්ණයෙන් හමුවීම ද මෙහිදී වැදගත් වේ. මෙරට මහරජු පවා ග්‍රාමණි යන වදනින් හඳුන්වා ඇති බව ඉන් ප්‍රකට වේ. (Paranavitana,S.,1970:78-79)

මෙම යුගයේ ආර්ථික තත්ත්වය පිළිබඳව විමසීමේ දී ගමික හා ''ගමණි''වරුන් ආර්ථිකය හැසිරවීමේ බලයක් සහිත පරිපාලන ඒකකයේ සිට කොට්ඨාශය දක්වා ද එතැන් සිට සමාජයේ ඉහළම

ස්තරය දක්වා ද (මහරජ) ආර්ථිකය හැසිර වූ පිරිස බව වටහා ගත හැකි ය. ඇතැම් ශිලා ලේඛනවල පුද්ගලයින් ග්‍රාම නාමයෙන් ද හඳුන්වා ඇත. පිදුරංගලින් හමු වූ ශිලා ලේඛනයක කොළගම ශිව නමින් ශිව නම් පුද්ගලයා හඳුන්වා ඇත්තේ ඔහු විසූ ගමෙහි නාමයෙනි. (ibid:67) නිගලමින් හමුවූ ශිලාලේඛනයක දුබලගම වාසය කරන උපාසක උත්තරගේ ලෙණ සංඝයාට පිදූ බව සටහන් කර තිබේ. (ibid:95) මෙයින් සනාථ වන්නේ රාජ්‍ය පාලනයේ දී මෙන් ම ආර්ථික තත්ත්වය පිළිබඳ විමර්ශනයේ දී ද ''ගම'' ප්‍රධාන ඒකකය වශයෙන් ක්‍රියාත්මකව පැවති බවයි.

මේ හැර කෑගල්ල දිස්ත්‍රික්කයේ යටහලෙන ලෙන් ලිපියට අනුව උපලිගම හා ක(බරග)ම යන ගම්වලින් කොටසක් මහාසුදස්සන නම් ලෙන සඳහා පුදා ඇති බව ප්‍රකට වේ. (Paranavitana,S.,1970:60) මෙයින් ගම්වලින් ලැබෙන ආදායම හෝ එම ගම්වලින් පිදූ අදාළ කොටසේ පරිභෝග අයිතිය පිදූ බව සනාථ වේ. මිහින්තලේ රාජගිරිලෙනකන්ද ශිලාලේඛනයක ''උපලවි'' නම් (ගමේ) වාසය කළ ''චුල ශොබා'' (චූඩ සෝභන) හා උපලවි (ගමේ) වසන තිස්සගේ පියා යන අය ලෙණක් කරවා පිදූ බව සටහන් වේ. (ibid:86) කුරුණෑගල මහමූකලන්යාය පද්දව පිහිටි ශිලා ලේඛනයක බගු නගරයේ වාසය කරන ''බොජික චූළහ'' විසින් ලෙන් පූජාවක් කළ බව සටහන් වේ. (ibid:96) එය හුදෙක් ගමක් නොවන අතර නගරයක් ලෙස සටහන් වීමත් (නකරක) ලෙස සටහන් වීමත්, චූළක විසින් ම පරිපාලනය කරන ලද බව (බොජික) සටහන් වීමත් වැදගත්කමක් උසුලයි. ආර්ථික තත්ත්වය පරීක්ෂාවේ දී පරිපාලන අයිතිය හිමිවූන්ට එම ගමෙන් උපදනා වස්තුවෙන් යම් කොටසක් හිමිවන බැවින් මෙලෙස ගම්මාන හෝ නගර භෝජකයින් හෙළිවන ශිලාලේඛන කිහිපයක් ම මූල බ්‍රාහ්මී යුගයට අයත් ව හමු වේ. පරණවිතාන අදහස කරන්නේ මෙම භෝජකයින් එම නගරයෙන් හෝ ගමෙන් ලැබෙන ආදායම එකතු කොට රජුට ලබා දුන් බවත්, ඒ වෙනුවෙන් ඔහුට ද යම් කොටසක් හිමි වූ බවත් ය. (Paranavitana,S.,1970:ca) ''පියක පසන''හි අයිතිකරු වූ (බොජික) නගර ගුප්ත කෙනෙක් පිදූ ලෙනක් අනුරාධපුර දිස්ත්‍රික්කයේ ගල්කන්දේගමින් හමුවේ. (ibid: 14) මෙහි ''පියකපසන'' යනු ස්ථානීය සංඥා නාමයකි. වටුකගම භෝජක වූ පරුමක තිස්ස පිදූ ලෙනක් මාතලේ දිස්ත්‍රික්කයට අයත් දඹුල්ලෙන්

හමුවේ. (ibid:65) ''බම නගර'' භෝජක පරුමක රොත විසින් පිදූ ලෙනක් තෝරවමයිලෑවෙන් ද (ibid:81) ''තොට'' හෝ ''තොටමණ'' භෝජකවරයෙක් වශයෙන් ක්‍රියා කළ උත්තර පිදූ ලෙනක් රත්නපුර දිස්ත්‍රික්කයේ කණ්ඩලමින් ද හමුවේ. (ibid:66) තෘණභූමියක් පාලනය කළ භෝකවරයෙක් විසින් පිදූ ලෙන් පූජාවක් පිළිබඳ තොරතුරු අවුකනින් හමු වේ. (ibid:91) මෙහි ඇති වැදගත්කම වන්නේ තෘණ භූමිය ආර්ථික උත්පාදන ක්‍රියාවලියේ අංගයක් ලෙස පැවතීම යි. ගවයන් ඇති දැඩි කිරීම කෘෂිකාර්මික ජීවන රටාවෙහි එක් වැදගත් අංගයකි. ඒ අනුව ගවයන් ඇති දැඩි කළ පිරිස් වෙත මිලයට ඔවුන් වෙනුවෙන් තෘණ සැපයීමට තෘණ භූමියේ හිමිකරුවන් ක්‍රියාකරන්නට ඇති බවත්, ඒ වෙනුවෙන් යම් වැදගත් ධනයක් රජු වෙත උත්පාදනය වන්නට ඇති බවත්, එම තෘණ භූමිය පාලනය කළ පිරිස භෝජකවරුන් වශයෙන් ක්‍රියාකරන්නට ඇති බවත් මේ අනුව නිගමනය කළ හැකිය.

''අයක'' වශයෙන් හඳුන්වනු ලැබූ ආදායම් භාර නිලධාරීන් තමන්ට අයත් ප්‍රදේශවලින් රජුට අයත් ආදායම් කොට්ඨාශය එකතු කොට බාර දෙන්නට ඇත. රජගලින් අභය මහරජුගේ අයකවරයෙක් ද (ibid:33) සිතුල්පව්ව දෙකුන්දරා වැවෙන් දෙවනපිය රජ තිශගේ අයකවරයෙක් (ibid:48) පිළිබඳව ද තිස්සමහාරාමයෙන් මහරජුගේ අයකවරයෙක් පිළිබඳව ද (ibid:53) කරුණු හෙළි වේ. මේ සියලු ම අයකවරුන් මහරජු කෙනෙක් යටතේ සේවය කළ ප්‍රාදේශීය ආදායම් භාර නිලධාරීන් වශයෙන් හඳුනාගත හැකිය.

මීට අමතරව රාජ කුමාරවරුන් හා කුමාරියන්ට සිටි අයකවරුන් පිළිබඳව ද කරුණු මූල බ්‍රාහ්මී ශිලාලේඛන තුළ අන්තර්ගතව පවතී. ඒ අනුව කන්දේගමකන්දෙන් හමුවූ ශිලා ලේඛනයකට අනුව තිස්ස නම් රජ කෙනෙකුගේ රාජ කුමාරයාට අයත්ව සිටි ගමික මහාතිස්සවරයෙක් පිළිබඳ කරුණු සටහන් වේ. (ibid:23) උත්තිය නම් කුමාරවරයෙකුගේ අයකවරයෙක් පිදූ ලෙනක් කුරුණෑගල දිස්ත්‍රික්කයේ හිපව්වෙන් හමුවේ. (ibid:75)

මේ හැරුණු විට රාජ කුමාරිකාවන්ගේ අයකවරුන් ද ලෙන් පිදූ බවට සාධක වෙයි. චිත්‍රා දේවියගේ අයකවරයෙක් වූ පරුමක සුජිත නම් තැනැත්තා පිදූ ලෙණක් මල්වත්ත නම් ස්ථානයෙන් හමු

වේ. (ibid:36) උත්පලා රාජ කුමාරිකාවගේ අයකවරයෙක් වූ පරුමක තිස්ස විසින් පිදූ ලෙණක් පිළිබඳව බලහරුකන්ද නම් ස්ථානයෙන් හමු වේ. (ibid:57)

තව ද යම් යම් ගම්වල කොටස් හෙවත් ආදායම් ලැබෙන කොටසක් ලෙන්වලට හෙවත් ලෙන් ආරාමවලට පිදූ අවස්ථාවන් ද මූල බ්‍රාහ්මී ශිලාලේඛනවලින් සොයා ගත හැකිය. එම තොරතුරු විග්‍රහ කිරීමේ දී පැහැදිලි වන්නේ එම විහාරාරාමවල ආරාම පරිහරණය සඳහා ගම්වල එකී කොටස් ලබාදීම මූල බ්‍රාහ්මී ශිලාලේඛන අවධියේ සිට ම පැවති බවයි. බ්‍රාහ්මණයාගම ශිලා ලේඛනයකට අනුව ගම්කවරයෙකුගේ පුතෙක් වූ සුමන කොටස් හයක් (06) ප්‍රදානය කොට (''පටක සයෙ'') ලෙණක් පිදූ බව කියවේ. (ibid:12) මෙයින් අදහස් කොට ඇත්තේ ගමෙන් ලැබෙන ආදායමෙක් කොටස් හයක් විය යුතු ය. අනදිගම නම් ගමෙන් එක කොටසකුත් බතසනගර නම් නගරයෙන් එක කොටසකුත් වසයෙන් කොටස් දෙකක් මහාසුදස්සන නම් ලෙණ සඳහා පිදූ බව ලෙනගල ශිලා ලේඛනයක සටහන් වේ. (ibid:60) එකී ප්‍රදානයන් පැහැදිලිව වෙන් කොට තිබීමෙන් රාජ්‍ය භාගය බොහෝ දුරට මේ තුළින් අදහස් කළ බව සිතිය හැකි ය. රජුට ගමෙන් හෝ නගරයෙන් යන සෑම ස්ථානයකින් ම කොට්ඨාශයක් උරුමව තිබූ බව පැහැදිලිව එයින් ප්‍රකට වේ.

මේ හැරුණු විට යටහලෙනින් ලැබෙන ශිලා ලේඛන පහක ම (05) කොටස් වශයෙන් කළ ප්‍රදානයන් ප්‍රකට වේ. එහි එක් ශිලා ලේඛනයක (793) (ibid:60) දුසතර ගමෙන් හා පටල ගමෙන් කොටසක් වශයෙන් ප්‍රදානය කර ඇත. තවත් ශිලා ලේඛනයක (792) උපලි ගමෙන් හා කචරගමෙන් කොටසක් වශයෙන් පුදා ඇත. තවත් ශිලා ලේඛනයක දැක්වෙන්නේ නිලය නම් නගරයෙන් හා සලිවය නම් ස්ථානයෙන් කොටසක් පුදා ඇති බවයි. (ibid:61) ගමගම නම් ස්ථානයෙන් (එනම් ගම විය යුතුය) කොටසක් පිදූ බව ඊලඟ (955) ශිලා ලේඛනයේ සටහන්ව ඇත. වැදගත් කරුණක් වන්නේ ඊලඟ ශිලා ලේඛනයෙහි ගමගමින් තවත් කොටසක් (අපර පටකෙ) පිදූ බව (796) ඊට ඔබ්බෙන් ලේඛිත ශිලා ලේඛනයෙහි සටහන්ව තිබීම යි. මෙම යුගයේ ආර්ථික තත්ත්වය පිළිබඳව විමර්ශනය කිරීමේ දී පෙනීයන්නේ ගම්වලින් රජුට අයත් කොට්ඨාශයන් හෝ පුද්ගල

සන්තක ඒකකයන්ගෙන් කොට්ඨාශයක් විහාරස්ථානයේ ප්‍රයෝජනය සඳහා පූජා කොට ඇති බව යි.

මුදල් හෝ භූමි ඒකකයන් සඳහන් කරීමෙන් ම පරිත්‍යාග කරන ලද අවස්ථාවන් ද මූල බ්‍රාහ්මී ශිලා ලේඛනවලින් හමුවේ. ගල්ලෙන විහාර ශිලා ලේඛනයක සටහන් වන්නේ අබ නම් ඇලේ ආවරණයෙන් (dam) අඩ කරීෂයක් ද පඩුවසගොඩ වාසස්ථානයෙන් කොටසක් ද යසසි කුඹුරු යායෙන් අවුලඩ නම් කුඹුරු කොට්ඨාශයක් ද ලෙන් විහාරය වෙත පුදා ඇති බව එහි සටහන් වේ. (ibid:98) මෙලෙස විවිධ අර්ථ වශයෙන් අඛණ්ඩ ධන සම්පත් සහිත විවිධ දේ පරිත්‍යාගය මෙම යුගයේ ද ප්‍රචලිව පැවැති බව එයින් පසක් වේ.

හැළඹගලින් ලද ශිලා ලේඛනයට අනුව පෙනීයන්නේ උත්තර නම් වැවත්, ජලාශයත් විහාරයට පිදූ බව යි. (ibid:100) මෙම ශිලා ලේඛන අයත් වන්නේ මූල බ්‍රාහ්මී යුගයේ පසු භාගයට වන බැවින් ක්‍රමයෙන් විවිධ ආර්ථික ශක්තීන් ආරාම වෙත පිදීම ක්‍රි. පූ. යුගයේ අවසන් භාගය තුළ සිදු වූ බව එයින් පසක් වේ. මීට ම සමාන තොරතුරු සටහන් වන මූල බ්‍රාහ්මී ශිලාලේඛන යුගයට අයත් ශිලාලේඛනයක් කයිකාවලින් ලැබේ. එහි මහාචූ(ළ)ක කෙතහි භූමි වශයෙන් සඳහනක් තිබේ. මහාචූල කෙතට අයත් භූමි යන අදහස ඉන් ලැබේ. (ibid:99) මුල්ම අවධියේ ලෙන් සකස් කර පිදීම් පිළිබඳ කරුණුවලට ශිලා ලේඛනවල අන්තර්ගතය සීමා වුව ද පසුකාලය වන විට ඊට වඩා බෙහෙවින් වැඩි තොරතුරු ප්‍රමාණයක් විවිධ ආර්ථික ආදායම් සහිත පරිත්‍යාගයන් ද පිදීම සිරිතක් වශයෙන් පැවති බව මෙයින් ප්‍රකට වේ.

ගම්මාන වශයෙන් පැවැති ජනාවාසවල අයිතිය රජු සතු වූ බව පෙනී ගිය ද පුද්ගලයින්ට ද එම අයිතිය හිමිව තිබූ බව සිතිය හැකිය. පොළොන්නරුව දිස්ත්‍රික්කයට අයත් දූවේගලින් සොයාගත් ශිලා ලේඛනයකට අනුව පරුමකවරු සිව්දෙනෙක් එක්ව ගමක් කරවා තිබෙන බව ප්‍රකට වේ. (ibid:21) පරුමක ඔහිත, පරුමක පුශගුත, පරුමක මිතස හා පරුමක තිස යන අය විසින් එකී අරිට්ඨ නම් ප්‍රමුඛ ග්‍රාමය ඉදි කොට ඇති බව එයින් ප්‍රකට වේ. මුල් යුගයේ සිට ම භූමියෙහි අයිතිය රජුට සේම සාමාන්‍ය ජනයාට ද හිමිව තිබූ බව මෙයින් ප්‍රකට වේ. ලක්ෂ්මන් එස්. පෙරේරා පෙන්වා දෙන ආකාරයට

රජුට අයත් අයිතිය විවිධ නිලයන් විසින් භාවිත කිරීම එම යුගයේ තත්ත්වයක් බව ප්‍රකට වේ. (Perera L.S.,2001:63)

ගම්වලට අමතරව නගර ද මෙම යුගයේ විහාරාරාම වලට පිදූ බවට සාධක මෙහි මුලින් දක්වා තිබේ. එහෙත් විවිධ නම්වලින් යුත් නගර මෙම යුගයේ පුදා ඇත. එසේ ම ගම් හා නගර වශයෙන් එක්ව ගෙන පුදා ඇති අවස්ථාවන් ද නිරීක්ෂණය කළ හැකිය. හෙන්නන්නේගල ශිලාලිපියක සටහන්ව ඇත්තේ ගිරි තිස්සගම, කරජිනිතිස්සගම, විලගම, මලුගම හා නොකවික යන ගම් ද ඒ සමගම කස්සප නගර (කසපනගර) ද විහාරයට පිදූ අයුරු එහි සටහන්ව තිබේ. (ibid:23) මේ හැර කුබර, කෙත, විය (වැව) වැනි ප්‍රදානයන් ද මෙම යුගයේ අග භාගයට අයත්ව පුදා ඇති බව ප්‍රකට වේ.

මූල බ්‍රාහ්මී යුගය වන විට ආර්ථික සම්පාදන ක්‍රියාවලියෙහි ඇල හා වැව යන අංග ප්‍රධාන සාධකයක් බවට පරිවර්තනය වී පැවතිණ. විවිධ ඇල මාර්ග හා වැව් කීපයක් පිදීම පිළිබඳව තොරතුරු මෙම යුගයට අදාළව හමුවේ. ජල සම්පාදනය කරනුයේ වැව් අමුණු හා ජලාශ මුල්කරගෙන ය. මෙහිදී වැව් හා ඇල මාර්ග පිළිබඳව පැහැදිලි සාධක සමූහයක් මූල බ්‍රාහ්මී ශිලාලේඛනවලින් හඳුනාගත හැකිය. වැව් සම්බන්ධයෙන් සාක්ෂි සමූහයක් හමුවන්නේ අපර බ්‍රාහ්මී යුගයේ වුව ද මූල බ්‍රාහ්මී අවධියේ පශ්චාත් භාගයේ දී ද ඒ සම්බන්ධ විස්තර ශිලා ලේඛනවල සටහන් කොට තිබූ බවට සාධක හමුවේ.

''වාපි'' යන වදන සහිතව වැව යන අර්ථයෙන් යෙදුණු වචන ඇති ශිලාලේඛන මෙම යුගයට අයත්ව දහයක් (10) පමණ හමුවේ. වැවේ නාමය දිගාවැව හෙවත් දීඝවාපිය බව කියැවෙන ශිලා ලේඛනයක් කුඩුවිල්වලින් හමුවේ. එහි සඳහන් වන ආකාරයට දීඝවාපියේ වාසය කරන වෙළඳ සමූහයක් විසින් ලෙන් පූජාවක් සිදු කොට තිබේ. (ParanavitanaS.,1970:37) මණ්ඩාගලින් හමුවූ ශිලා ලේඛනයකට අනුව එම ස්ථානයේ ලෙන් විහාරය පූජා කිරීමට අමතරව වැව නිර්මාණය කිරීම පිළිබඳව ද තොරතුරු සටහන් වේ. (ibid:44) තෝනිගල ප්‍රකට ශිලාලේඛන දෙකක ම සටහන්ව ඇත්තේ අඩ්ඩගිරික තිස්ස පබ්බත විහාරයේ සංඝයා සඳහා ඉදිකරවන ලද වැව ප්‍රදානය කළ බවයි. (ibid:82) පරුමක තිස්ස නම් කෙනකුගේ

වැවක් පිළිබඳව මෙහි සටහන් ව ඇත. මෙහි සඳහන් තවත් වැදගත් තොරතුරක් වන්නේ අච්ච නගරය හා තවිරිකිය නගරය ද විහාරයට පුදා ඇති බවයි. හාඳාගලින් හමු වූ ලෙන් ලිපියකට අනුව නක නකරක නම් වැවේ හිමිකරු විසින් ලෙන් පූජාවක් සිදු කොට ඇත. (ibid:89) මෙයින් පෙනී යන්නේ පෞද්ගලික වැව් හිමිකරුවන් සිටි බවත් ඔවුන් බුදුසමය විෂයෙහි එය පරිත්‍යාග කොට ඇති බවත් ය. එහිම ඇති තවත් ශිලා ලේඛනයකින් වැව් හිමියෙක් පිළිබඳ කියැවේ. (ibid) ''වපි හමික'' යන වදන මූල බ්‍රාහ්මී ශිලාලේඛන කිහිපයක ම යෙදී ඇති අතර ඔවුහු වැවේ අයිතිකරු වශයෙන් පරණවිතාන අර්ථ ගන්වා තිබේ. (ibid:121) වැව් හිමියෙක් වූ පරුමකවරයෙක් විසින් පිදූ බවක් පිළිබඳව හාඳාගල ශිලා ලේඛනයකින් තහවුරු වේ. (ibid:89) දිනහ නම් වැවේ තෘණ භූමියත් භෝජක බද්දත් ලෙණට පිදූ අවස්ථාවක් අච්කනින් හමුවේ. (ibid:91) එහි ම වැව් හිමියෙක් පිදූ ලෙණක් පිළිබඳව ද කරුණු හෙළි වේ. කුරුණෑගල ඒරියාවෙන් ලද වැවට සම්බන්ධ ගල් තලාවේ සටහන් කළ ශිලා ලිපියකින් හෙළිවන්නේ දීපිගල්ල විහාරය (දීපිගල විහාරයේ) සංඝයාට පරුමක යහපලගේ පුත් පරුමක හදනට අයත් වැව පිදූ බව යි. මෙම යුගයේ ලෙන් ආරාමවලට නොව මහාසංඝයාට අදාළ වැව් පූජා කිරීම පිළිබඳව ඉතා වැදගත් සාක්ෂි සපයන අවස්ථාවක් වශයෙන් එය සැලකිය හැකිය. (ibid:99)

''වාපි'' යන වදන වෙනුවට ''වවි'' යන වදන සහිත ශිලාලේඛන දොළහක් (12) මූල බ්‍රාහ්මී යුගයෙන් සොයාගෙන තිබේ. එයින් වැවේ අයිතිකරු යන අදහස ඇති ''වපි හමික'' යන වදන ''වවි හමික'' වශයෙන් යෙදුණු අවස්ථා හයක් (06) හමුවේ. ඒ අනුරාධපුර ගල් ගේ (ibid:88) අනුරාධපුර අවුකන (ibid:92) කුරුණෑගල ගනේකන්ද විහාරය (ibid:97) කුරුණෑගල සැස්සේරුව (ibid:98) කුරුණෑගල තෝරවමයිලෑව (ibid:99) කුරුණෑගල තෝරවමයිලෑව දෙවන ලිපිය (ibid) යන ශිලාලේඛන තුළිනි. මෙලෙස රජු හැර වපි හමික විසින් පාලනය කළ හෝ ඔවුන්ට අයත්ව තිබූ වැව් පිදූ අවස්ථා ගණනාවක් මෙම යුගයේ ශිලා ලේඛනවලින් හමුවේ. මේ පිළිබඳව නිගමනය කළ හැක්කේ එකල ආර්ථිකයෙහි පැහැදිලි බලයක් හා ශක්තියක් වැව් ආශ්‍රිත උරුමකරුවන්ට හා රජුට හිමිව තිබූ බව යි. මේ පිළිබඳව එල්. එස්. පෙරේරා ද වැව් ආශ්‍රිත ආදායම් මාර්ග ස්ථාවරව පැවති බව

පිළිගනියි. (Perera L.S.,2001:63) ''වපිහමික'' යන වදන නොමැතිව වැව් පිළිබඳව වෙනත් තොරතුරු ''වවි'' යන වදන සහිතව යෙදුණු තවත් ශිලා ලේඛන කිහිපයක් මෙම යුගයට අයත්ව හමු වී තිබේ. කුරුණෑගල කොතලකිමියව නම් ස්ථානයෙන් හමු වූ එක් ශිලාලේඛනයක ඉතා වැදගත් තොරතුරක් අඩංගු වෙයි. එහි සඳහන් වන ආකාරයට උත්තිය තෙරුන්ගේ ලෙන සියලු සත්ත්වයන්ට යහපත පිණිස පුදා ඇත. තව ද වස් විසූ භික්ෂු සංඝයාගේ ප්‍රයෝජනය සඳහා මෙහි අතිරික්තයක් ඇතහොත් සෙසු සංඝයාගේ ප්‍රයෝජනය සඳහා යෙදවිය යුතු බව ඉන් නියෝග කොට තිබේ. තව ද දකබරි ගමේ වැව හා උපාසක දත්තගේ කොටස යන දෙකම මෙකී ලෙණට හෙවත් එහි කෙරෙන කාර්යය සඳහා පුදා ඇත. (Perera L.S.,2001:96) මෙහිදී වැදගත් වන්නේ දත්තට ආදායම් කොට්ඨාශයක් හිමිව පැවතීම යි. එසේ ම වැව ද වැව හා ඊට අයත් බදු පිළිබඳව මෙම යුගයේ ද වැඩිමනක් තොරතුරු නොවූවත් අතරින් පතර තොරතුරු කිහිපයක් හමු වන බව පැහැදිලි වේ. කුරුණෑගල හලඹගලින් හමු වූ ශිලා ලිපියකට අනුව උත්තරගේ වැව තිස්ස තෙරුන්ගේ රඳවනය නොහොත් ටැංකිය වෙත පරිත්‍යාග කොට තිබේ. (කුමිය) (ibid:100) යාපහුවෙන් හමු වූ ලෙන් ලිපියක මමතගේ නකරක වැවත්, කොරිබෙව්රෙ වැවත් සාංඝික කළ බව සඳහන් වේ. (Dias M,1991:03) මෙයින් ආදායම් මාර්ගයක් ලෙස වැව් විහාරයට පිදීම මූල බ්‍රාහ්මී අවධියේ පැවති බවත් එය තත් යුගයේ ප්‍රධාන ආර්ථික මාර්ගයක් වූ බවත් වටහාගත හැකිය. මීට අමතරව එල්ලාවල මේධානන්ද හිමියන් කිය වූ එසේ ම සද්ධාමංගල කරුණාරත්න විසින් විමර්ශනය කළ ශිලා ලේඛනයක් කරඳහෙළින් හමුවේ. එහි ගලඋතගිරි වැව හබුතලගල විහාරයේ මහා සංඝයා වෙත පරිත්‍යාග කොට ඇත. (Karunarathna S. E Z Vii,1984:63) එහි ම තවත් ශිලා ලේඛනයක උපාසිකා පුස විසින් තමාට අයත් හමණවිර වැව සංඝයාට පුදා ඇත (ibid) මේ කරුණු කියාපාන්නේ සාමාන්‍ය මහජනයාට පවා වැව් අයත්ව පැවති බවයි. එය මෙරට තත්කාලීන ආර්ථිකයේ ඉතා ප්‍රබල පැතිකඩක් කෘෂි ආර්ථිකය සතුව පැවති බව නිගමනය කිරීමට සාධකයක් ද වේ. වැව් පිළිබඳව සඳහන් කිරීමේදී යාපහුවෙන් ලද කෙටි ලෙන් ලිපියක මහා සංඝයාට පිදූ වැව් දෙකක් පිළිබඳව කියැවේ. :Dias M.,1991:05) මෙම වැව්වල සියලුම වර්ගයේ බදු විහාරයට හෝ සංඝයාට අයත් වූ බව මේ අනුව සිතිය හැකිය.

වැව්වලට අමතරව කුඹුරු පරිත්‍යාග කළ බව නාඋල්පත ශිලා ලේඛනයකින් කියවේ. ක්‍රි.ව.පළමු සියවසට අයත් කළ හැකි නාඋල්පොත (B) ශිලාලේඛනයෙහි ''ගමණි අබයෙ කුබර සග දිනි'' වශයෙන් යෙදී ඇත. මෙහි ගාමිණි අබය යනු ගාමිණි අභය වළගම්බා රජු ලෙස හඳුනාගත හැකිය. එහෙත් මෙහි පිතමහරජ වශයෙන් හෝ මහරජ වශයෙන් හෝ යෙදී නැත. එවිට එම යුගයේ කුඹුරු පරිත්‍යාග යන් ද පැවති බව සනාථ වේ. (Wickramasinge D.M de Z,1912:148) කයිකාවලින් ලද මූල මූල බ්‍රාහ්මී ශිලාලේඛනයක ''මහවුලක කෙතහි බුමි'' වශයෙන් යෙදී තිබේ. (Paranavitana,S.,1970:99) මෙහි ''කුඹර'' වෙනුවට ''කෙත'' යන වදන යෙදී තිබේ. කුඹුරු හා කෙත් ද මෙම යුගයේ පශ්චාත් භාගයෙහි දී පුදා ඇති බව මෙයින් සනාථ වේ. එහෙත් මෙම කාල පරාසයට ම අයත් රජවරුන් පැහැදිලිව හඳුනාගත හැකි ඉලනාග රජුගේ තිස්සමහාරාම ශිලාලේඛනය, ලජ්ජිතිස්ස රජුගේ දූවේගල ශිලාලේඛනය හා කැලෑපිටිමුල්ල වැනි ශිලා ලේඛනයන් ද මෙම යුගයට ම කාලය වශයෙන් ගත් විට සමාන වේ. එහෙත් එම ශිලා ලේඛනවල අන්තර්ගතය අපර බ්‍රාහ්මී යුගයට අයත් කළ හැකි ය. එම ශිලාලේඛන මෙම යුගයට අයත් කිරීමෙන් ආර්ථිකය හා සමාජ තත්ත්වය පිළිබඳව තොරතුරු හෙළි කළ හැකි වුව ද අන්තර්ගතය පැහැදිලි ලෙස ම අපර බ්‍රාහ්මී යුගය නියෝජනය කරනු ලබන බව සඳහන් කළ හැකිය.

මූල බ්‍රාහ්මී ශිලාලේඛන ආශ්‍රිත තොරතුරුවලින් ශ්‍රී ලාංකීය සමාජ සංස්ථාවේ ප්‍රධාන ඒකකය වන ගම පිළිබඳ තොරතුරු හෙළි වන්නේ ඉතා අල්ප වශයෙනි. මේ පිළිබඳව අවකාශය යොමු කළ ලක්ෂ්මන් එස්. පෙරේරා පවසන්නේ මෙම යුගයේ ග්‍රාමීය ආර්ථික රටාව පිළිබඳව වැඩි විස්තරයක් හෙළි නොවන බවයි. (Perera L.S., 2001:65) මෙම යුගයට අදාළව වැව් හා ජලාශ පිළිබදව ද ලැබෙන තොරතුරු ඉතා හීනය. තෝනිගල හා ඊරියාව වැනි ස්ථානවලින් ශිලා ලේඛන තුනක් ලැබී තිබුණ ද ඒවා ප්‍රමාණවත් සාක්ෂි නොසපයයි. කෙසේ වෙතත් මෙම යුගයට අයත් ශිලා ලේඛනවල වස්තු විෂය පිළිබඳව විමසීමේදී ඒ පිළිබඳ තොරතුරු තිබුණ ද ඒවා ප්‍රමාණවත් ලෙස ඉදිරිපත් වීමක් ශිලාලේඛනවලින් හෙළි නොවන බව නිගමනය කළ හැකිය.

මෙරට වාරි කර්මාන්තය පිළිබඳව විමසීමේ දි ක්‍රිස්තු පූර්ව අවධියේ සිට ම වාරි සංස්කෘතියට රාජ්‍ය අනුග්‍රහය ලද බව වංසකථාගත සාධකවලින් හඳුනාගත හැකිය. පණ්ඩුකාභය රාජ්‍ය යුගය පිළිබඳව විස්තර කරන මහාවංසය රජු අභිෂේකය සඳහා ස්නානය කළ ස්වයංජාත විල කැණ වූ බව සඳහන් කොට තිබේ (ම.ව.10:83-84) එසේ ම එය ජයවැව යන නමින් නම් කළ බව ද එහි සටහන්ව තිබේ. එසේ ම පණ්ඩුකාභය රජු ඉදිකළ වැව අභය වැව යන නමින් නම් කළ බව ද වංසකථාව විස්තර වශයෙන් වාර්තා කරයි. (ම.ව.10:88) මෙයින් පෙනී යන්නේ පණ්ඩුකාභය යුගය වන විට මෙරට වාරිකර්මාන්තය ඉතා ප්‍රබල ම අංගයක් වූ වැව් ඉදිකිරීම ආරම්භව පැවැති බවයි. මෙම යුගයේ වැව්වල අයිතිය ප්‍රධාන වශයෙන් රජුට හිමි විය. එහෙත් පුද්ගලික වැව් හිමියන් ද සිටි බව ඉහත පෙන්වා දෙන ලදි. තව ද පරිපාලනමය වශයෙන් එකී වැව්වලින් ලද ආදායම ඉපයීම් මාධ්‍යයක් ලෙස වැව් හිමියාට හෝ රජුට හිමි වූ බව ශිලාලේඛනවල එන තොරතුරු ආශ්‍රයෙන් සනාථ වේ. වසභ රාජ්‍ය සමයට අයත් මඩවල ශිලාලේඛනයෙහි දැක්වෙන්නේ වසභ රජුගේ කාලයේ දී ''මයිලව් හවර තිස්ස'' මඩවල විහාරය කළ බවත් ඒ සඳහා ''අමරගලක'' වැවේ ජලබද්ද ප්‍රදානය කළ බවත් ය. (Paranavitana S.,1970:73) මෙම ශිලාලේඛනය ප්‍රකට ලෙස ම පුද්ගලික වැව් හිමියන් වසභ රාජ්‍ය සමයේ හෙවත් අපර බ්‍රාහ්මී යුගයේ ආරම්භය වනවිටත් සිටි බව පැහැදිලි වන්නකි. විහාරේගල ගිරිලිපියේ ද මීට සමාන ප්‍රදානයක් සටහන්ව තිබේ. එහි සඳහන් වන්නේ සභ රජතුමා ඒකදෝරික වැව කහවණු පන්සියයක් වියදම් කොට මිලදීගෙන කහවණු පන්සියයක් වියදම් කොට එහි පස් ඉවත් කරවා ඒකදෝරික විහාරයේ සංඝයාට පරිත්‍යාග කළ බවයි. (ibid:61)මෙයින් ප්‍රකාශ වන්නේ මහරජු වුව ද වෙනත් පුද්ගලයින්ට අයත් දේ සඳහා මිලදී ගැනීම සිදු කළ යුතු වූ බව යි. සාමාජීය වශයෙන් ගත් කල රජුට වුව ද රටෙහි නීතිය සමාන ලෙස ක්‍රියාත්මකව පැවති බව ද මෙයින් ප්‍රකාශ වේ. කිරිවෙහෙර පුවරු ලිපියෙහි සටහන්ව ඇත්තේ ''දක වහනක'' වාසයකරන ජ්‍යෝෂ්ඨ නන්ද තෙරුන් වහන්සේ කඩහවපිගම ස්තූපය විශාල කළ බව යි. තව ද මෙම ස්තූපයේ ආයක හතර සඳහා පඩිපෙළ ද සකස් කළ බව එම ශිලාලිපියේ සටහන්ව ඇත. (EZ.Vol.III,1933:215) මෙයින් පුද්ගලික ඉඩම් හිමියන් මෙන් ම වැව් හිමියන් ද සිටි බව මෙන් ම ඔවුන්ට ස්තූප

විශාල කොට බැන්දවීම වැනි රජුට අයත් කටයුතු ඉටු කිරීමට පවා බලයක් තිබූ බව එයින් පසක් වේ.

මෙම යුගයේ ඉඩකඩම් ආදිය මැනීමේ ඒකකයන් පිළිබඳව ඇත්තේ ඉතා අල්ප තොරතුරු ප්‍රමාණයක් පමණි. ඒ මෙම යුගයේ ශිලාලේඛනවල වස්තු විෂයෙහි එම තොරතුරු අඩංගු නොවන බැවිනි. එහෙත් පශ්චාත් බ්‍රාහ්මී යුගයට අයත් කළ හැකි මෝලාහිටියවෙලේගල ගිරි ලිපියෙහි එම යුගයේ භාවිත කළ කරීෂ පිළිබඳව තොරතුරක් සටහන්ව තිබේ. එහි දැක්වෙන ආකාරයට ''නකවිලි'' හා ''ලොදරි'' යන ස්ථානවලින් විහාරයේ භික්ෂූන්ගේ ප්‍රයෝජනය සඳහා කරීෂයක් බැගින් ප්‍රදානය කළ බව සටහන් කොට තිබේ (Paranavitana S.,1983:05)

මූල බ්‍රාහ්මී ශිලාලේඛන යුගයේ මුදල් ව්‍යවහාරය පිළිබඳ විමර්ශනය කිරීම ද ආර්ථික තත්ත්වය අවබෝධ කර ගැනීමට බෙහෙවින් ඉවහල් වේ. ශ්‍රී ලාංකේය සමාජය කෘෂිකාර්මික සමාජයක් ලෙස ආරම්භක යුගයේ සිටම ක්‍රියාත්මක වූ බැවින් මුදල් ව්‍යවහාරයට වඩා ජනප්‍රිය වූයේ භාණ්ඩ හුවමාරු ක්‍රමය යි. මේ නිසා මුදල් හදල් පිළිබඳව තොරතුරු අඩුවීමට එය ද යම් බලපෑමක් කර තිබෙන බව සනාථ වේ. (Perera L.S.,2001:68) කාසි භාවිතය පිළිබඳව විමසීමේ දී පළමුවෙන් ම මෙරට හමුවන හස් එබූ කහාපණ හෙවත් හස් එබූ කාසි නාණක විද්‍යාඥයින් ක්‍රි. පූ. දෙසීය (200) ක්‍රි. ව. 200 කාල පරාසයට අයත් කරයි. (සිරිසෝම ඇම්.එච්, අමරසිංහ ගීතා,1986(vi) බොහෝ විට භාණ්ඩ හෝ ධාන්‍ය හුවමාරුව කාසි භාවිතය කළ යුගයේ ද ඉන් එපිට ද සිදු වූ බව පැහැදිලි වේ. මේ නිසා මුදල් ව්‍යවහාරය ජනයා වෙත ව්‍යාප්ත වීමට සියවස් ගණනාවක් ගත කර ඇති බව අවබෝධ කර ගැනීම අපහසු නොවේ. එහෙත් මූල බ්‍රාහ්මී ශිලාලේඛන අතර මාම්පිට විහාර ශිලාලේඛනයේ කහවණු දෙකක් හා තවත් අයෙක් පිදූ තවත් එක් කහවණුවක් පිළිබඳව තොරතුරු සටහන් වේ. මෙම ශිලා ලේඛනයෙහි කොටසක් කැඩී ගොසිනි. (Paranavitana,S.,1970:60) මුදල් ව්‍යවහාරය පිළිබඳව මීට වඩා වැඩි තොරතුරක් එකී ශිලාලේඛනවලින් හමු නොවන බව පැහැදිලි වේ.

මුදල් ව්‍යවහාරය සේම වෙළඳාම පිළිබඳව තොරතුරු ආර්ථික තත්ත්වය විග්‍රහ කිරීමේදී බෙහෙවින් වැදගත් වේ. මෙම යුගයට අයත් ඇතැම් මූල බ්‍රාහ්මී ශිලාලේඛනවල වෙළෙඳාම හා ගනුදෙනු පිළිබඳ පුවත් හෙළිවන අවස්ථා පවතී. එහි එක් ශිලා ලිපියක ඇත්තේ ගමක බැම්මක් සකස් කිරීම වෙනුවෙන් රජු නවදහසක් කුලී වශයෙන් ගෙවා තිබෙන බව යි. (ibid:97) මෙහි නවදහසක් යනු බොහෝවිට කහවණු නවදහසක් විය හැකිය. එසේ ගත් විට රජු වුව ද කුලී කරුවන් සඳහා මිල ගෙවා ම වැඩ ගත් බව පැහැදිලි වේ. ඒ අනුව එම යුගයේ මුදල් ව්‍යවහාරයෙන් පඩි නඩි ගෙවා තිබෙන බව පසක් වේ. ගණේකන්ද විහාරයේ ම ඇති තවත් ලිපියකින් හෙළි වන්නේ වෙළඳ සමාග මක් පිළිබඳ පුවතකි. එහි ''සිදවිය'' නම් වෙළෙඳ සමාගමේ (පූකන) සාමාජිකයන් විසින් ලෙණක් කරවා පුදා තිබේ. තව ද එකී වෙළෙඳ සමාගමේ කම්මල්කරු තිස්ස ප්‍රධානියා වන අතර නාග උප ප්‍රධානියා ලෙස කටයුතු කර ඇත. (ibid:96)

මේ හැර උළු ගඩොල් වෙළඳ සමාගමක කටයුතු කළ නාග කෙනෙක් පිළිබඳව දුර්ලභ සඳහනක් කොන්ග්‍රායන්කුලම් ශිලා ලේඛනයෙන් හෙළිවේ ඒහි ''හතනදම රම ගනකහ නගරහ ඉටික පග රතකහ වණිකපුත මහනගයහ අඩි'' වශයෙන් සටහන්ව තිබේ. (විමලඛන්ති හිමි ජී, 2018:16) ''අත්තරදමන යන ස්ථානයෙහි පිහිටි ගණකගේ නගරයෙහි වාසය කරන උළු ගඩොල් වෙළෙඳ මධ්‍යස්ථානයෙහි සේවයේ නියුතු වෙළෙඳපුත් මහානාගගේ ඇල'' වශයෙන් එහි යෙදී තිබේ. මෙයින් උළු හා ගඩොල් වෙළඳාම මෙරට තිබූ බවත්, ඒ සඳහා වෙළඳ නගරයෙහි ඉඩ ප්‍රස්ථාව වෙන්ව තිබූ බවත්, පැහැදිලි වේ. තව ද එම ස්ථානයන්හි සේවය කරන ගණකාධිකාරීවරයෙක් පිළිබඳව ද මෙහි සටහන් වේ. මේ නිසා වෙළඳාම හා ගනුදෙනු පිළිබඳව සාකච්ඡාවේදී මෙම සඳහන ඉතා අගනා විස්තරයක් සපයන්නක් බව සඳහන් කළ හැකි ය.

මෙම කාල පරාසයට අයත්වන පුගහ, පුගියන, පුගන වශයෙන් සමාගම් පිළිබඳව ලියැවුණු ශිලාලේඛන අඩුම තරමින් දහයක් ලැබේ. ඒවායින් මහා කපුගොල්ලෑව ශිලාලේඛනයක පුගියන හෙවත් වෙළෙඳ සමාගම යන අර්ථය ඇති වදන ද (Paranavitana,S.,1970:11) අලියාකඩින් ලැබෙන ශිලා ලිපියක අලි පවතෙහි පුගියන (ibid:97)

හෙවත් අලිසපවතෙහි වෙළෙඳ ශ්‍රේණියක් පිළිබඳව ද බෝවත්තේගල ශිලාලේඛනයක කබොජිය මහපුගියහ වශයෙන් කාම්බෝජ මහා වෙළඳ සමාගමක් විසින් කළ ලෙන් පූජාවක් ද (ibid:42) ගෝනගලින් ''මඩුකශලිය පුගියන'' වශයෙන් මඩුකශලිය වෙළෙඳ සමාගම පිළිබඳව ද (ibid:50) හම්බන්තොට වෙහෙරකෙමින් ''තනවය පුගන'' වශයෙන් තනවය නම් වෙළෙඳ ශ්‍රේණිය පිදූ ලෙණක් පිළිබඳව ද (ibid:52) වැලඑල්ලුගොඩකන්ද ශිලාලේඛනයකින් ''පුගියන ලෙන'' වශයෙන් වෙළඳ ශ්‍රේණියක් කළ ලෙන් පූජාවක් පිළිබඳව ද (ibid:55) මඩුගස්මුල්ල ශිලාලේඛනයක ''පුගන ලෙන'' වශයෙන් යෙදෙන අතර එහි ජ්‍යෙෂ්ඨයා පණ්ඩුගුත්ත නම් වන බව ද දක්වා ඇත. (ibid:44) මීට අමතරව වෙළඳ සමාගමක ප්‍රදානයක් පිළිබඳව කුඩාගලින් ද ශිලාලේඛනයක් ලැබේ. එහි ''පුගන ලෙණෙ'' වශයෙන් යෙදී ඇත. (Dias M,1991:03) බුදුගල්ලෙන ආරණ්‍ය සේනාසනයේ ''මපුගියන ලෙණ'' වශයෙන් මහාවෙළඳ සමාගමක් පිළිබඳ කියවෙන ලෙන් ලිපි දෙකක් ලැබී තිබේ. (මේධානන්ද හිමි එ,1999:44) තව ද මෙම සමාගම යන අර්ථයම ඇති ''පුකන'' වශයෙන් යෙදුණු ශිලාලේඛන දෙකක් (02) මූල බ්‍රාහ්මී ශිලාලේඛනවලින් හමු වී තිබේ. ඒ අවුකන නම් ස්ථානයෙනි. එහි පුකන ලෙණ පඩගම දත ජෙට'' වශයෙන් යෙදී ඇත. පඩගම වසන දත්ත නම් සමාගම් ප්‍රධානියා විසින් එම ලෙන කරවා පුදා ඇති බව ප්‍රකට වේ. (Paranavitana S.,1970:91) තව ද ගණේකන්ද විහාරයෙන් ලැබෙන මූල බ්‍රාහ්මී ලෙන් ලිපියක ''පුකන ලෙන'' වශයෙන් සමාගමක ලෙන් පූජාවක් ප්‍රකට වේ. (ibid:96) මෙම ශිලාලිපියේ එම සමාගමේ ප්‍රධානියා හා උපප්‍රධානියා යන දෙදෙනාම පිළිබඳ කරුණු සටහන් වීම විශේෂ වැදගත්කමක් උසුලයි. කුරුණෑකල්ලුවලින් ලද ලෙන් ලිපියක ඇත්තේ දිපිකුලික නම් සමාගමක් විසින් එකී ලෙන් පූජාව කළ බවයි. (ibid:25) මෙලෙස වෙළෙඳ සමාගම් හා සමාගම් පිළිබඳ මෙම යුගයේ ශිලාලේඛනවල කරුණු සඳහන්ව තිබෙන බැවින් එම යුගයේ වෙළඳාම හා සමාගම් පැවති බවත්, එය ආර්ථික තත්ත්වය පිළිබඳ විමර්ශනයේ දී වැදගත් සාධකයක් බවත් සඳහන් කළ හැකිය. රාමේෂ්චන්ද්‍ර මජුම්දාර් දක්වා ඇති ආකාරයට සමාගම් හා වෙළඳ සමාගම් පිළිබඳ ඉන්දීය නිදසුන් ක්‍රි. පූ. 5 - 6 සියවස් දක්වා විහිද යයි. මේ සඳහා වඩාත් ප්‍රචලිත සාහිත්‍යය වන්නේ ජාතක සාහිත්‍යය යි. ජාතක සාහිත්‍යයේ එන ජාතක කතාවලට සම්බන්ධ යම් පිරිසක් එකතු වී සමාගම සකස්

කරගත් ආකාරය පසක් වේ. එහිදී ප්‍රධානියෙක් රජුට එම සමාගමෙන් පත් කර ගන්නා අතර ඔහු එම පිරිසේ වඩාත් වැඩිමහලු අත්දැකීම් වැඩි කෙනා ද වෙයි. (Majumdar.R.C, 1922:20-24) ''මහවඩ්ඪකී ගාමො කම්මාරගාමො'' වශයෙන් මහවඩුවාගේ ගම කර්මාන්ත ග්‍රාමය වශයෙන් පවුල් දහසක් තරම් පිරිසක් විසූ සමාගම් සහිත ග්‍රාමවරයන් මෙම යුගයේ ක්‍රියාත්මකව පැවති බව මජුම්දාර් දක්වා තිබේ. මේ තනතුරු බොහෝවිට බෞද්ධ හා ජෛන වැනි ආගමික සාහිත්‍ය කෘතිවල පෙනෙන නිදසුන් තුලින් ස්ථාවර කරගත හැකි ය. (ibid) මෙම තොරතුරු බොහෝවිට ශ්‍රී ලංකාවේ සමාගම් පිළිබඳ විශ්ලේෂණයේ දී ද සමාන වශයෙන් භාවිත කළ හැකිය. මජුම්දාර් දක්වන ලද ආකාරයට මෙකී දේශීය සමාගම්වල පෙණෙන පාරිභාෂික පැරණි වදන්වල විශේෂයෙන් පශ්චාත් වෛදික යුගයේ වදන්වල ''පුග'' හා ''ගණ'' සමාගම, සමූහය යන වදන් බෙහෙවින් දැකිය හැකිය. මෙම වදන් පැහැදිලිව ම සමාගම් හෙවත් සංගම් වාශයෙන් පෙනී සිට ඇති අතර ම ඒවා ග්‍රාමීය වශයෙන් සංවිධානය වී පසුව පුළුල් වී ගිය සමාගම් වශයෙන් හඳුනාගත හැකි වේ. (ibid:138)

ආර්ථික තත්ත්වය පිළිබඳව විමසීමේදී දිග දුර වෙළඳාම වැදගත් සාධකයක් සේ ගිණිය හැකිය. මෙහිදි දිග දුර වෙළඳාම පිළිබඳව විමර්ශනයේදී රට අභ්‍යන්තරයේ වෙළඳාමට හා මුහුදින් එතෙර රටවල වෙළඳාම පිළිබඳව වශයෙන් කොටස් දෙකක් දිස්වේ. බොහෝ ජාතක කතාවල මුහුදින් එතෙර වෙළඳාම පිළිබඳව ද කරුණු සටහන් වේ. මූල බ්‍රාහ්මී ශිලාලේඛනවල පෙනෙන ''නවික'' යන වදන දිගු දුර වෙළඳාම පිළිබඳ සාකච්ඡාවේ දී ඉතාමත් වැදගත් වදනක් වශයෙන් ගිණිය හැකිය. ඒ භාවිතයන් රටකින් තවත් රටකට හෝ මුහුද මගින් යාත්‍රාකර රටකට නගරයක සිට වෙනත් නගරයකට හෝ සංක්‍රමණය වීම එම යුගයේදී ද සිදු සිදුකොට ඇති බැවිනි. ''නවික'' යන වදන යෙදුන ලෙන් ලිපි දෙකක් සොයාගෙන තිබේ. ඉන් එක් ලෙන් ලිපියක් අභයගිරියෙන් ලැබී ඇති අතර ''නවික කාරවහ අශනෙ'' වශයෙන් ''නාවිකයෙකු වූ කාරවගේ ආසනය''යි වශයෙන් සටහන් කොට තිබේ. (Paranavitana S.,1970:07) එසේ ම පරමාකන්ද ලෙන් ලිපියක ''නවිකහ ලෙනෙ'' වශයෙන් යෙදී තිබේ. එයින් නාවිකයකු වූ තිස්ස නම් අයකු විසින් එම ලෙන කරවා තිබේ. (ibid:133) එයින් පැහැදිලි වන්නේ නාවික කටයුතුවල යෙදුණු පිරිස්

අතර ප්‍රමුඛයින් ලෙන් පූජාවට සම්බන්ධ වී සිටි බව යි. මෙම ලෙන පිදූ ''නවික තිස'' පරුමක යන විරුදය දැරුවෙක් බව ද සඳහන් වීමෙන් ඒ බව තවදුරටත් සනාථ වේ. ආර්ථික තත්ත්වය විමසීමේදී දිගුදුර වෙළඳාම සම්බන්ධයෙන් නාවික තනතුරු දැරූ ප්‍රමුඛයින් වැඩි මෙහෙවරක් ඉටු කරන්නට ඇත.

ආර්ථික තත්ත්වය විමසීමේදි සමාජයේ ඉහළ හා පිළිගත් තනතුරු දැරූ පුද්ගල ශ්‍රේණි පිළිබඳව ද අවධානය යොමු කළ යුතු වේ. ඒ අතර ද මෙම යුගයේ විසූ වෛද්‍යවරුන් පිළිබඳ තොරතුරු ''වෙඣ'' හෝ ''වෙජ'' යන වදනින් හඳුනාගත හැකිය. මූල බ්‍රාහ්මී අභිලේඛන අතර ''වෙඣ'' වශයෙන් යෙදුණු වදන සහිත ලෙන් ලිපි දෙකක් (02) හමුවේ. හම්බන්තොට මගුල් මහාවිහාරයේ ලෙන් ලිපියක ''වෙඣ තිශහ ලෙණෙ'' වශයෙන් වෛද්‍යවරයෙකු වූ තිස්සගේ ලෙණ වශයෙන් එම ලෙණ හඳුන්වා තිබේ. (Paranavitana S.,1970:51) එසේ ම පිච්චන්දියාවෙන් ලද ශිලා ලිපියක ''මහරඣ දෙවනපිය ගමණි තිශ'' නම් රජකුට අයත් වෛද්‍යවරයා බ්‍රාහ්මණ ගොබුතිය (බමණ ගොබුතිය) වශයෙන් හඳුන්වා දී තිබේ. (ibid:83) මෙහි වෛද්‍යවරයා බ්‍රාහ්මණයෙකු වශයෙන් ද හඳුන්වා තිබීම සැලකිය යුත්තකි. මෙම වෛද්‍යවරයා රාජකීය වෙදැදුරු වශයෙන් ද ක්‍රියා කරන්නට ඇති බව බොහෝවිට නිගමනය කළ හැකිය.

මූල බ්‍රාහ්මී ශිලාලේඛන ආශ්‍රයෙන් තත් යුගයේ ආර්ථික තත්ත්වය විමර්ශනයේදී තවත් විමර්ශනයට ලක් කළ යුතු වදනක් වශයෙන් ''රුපදක'' යන වදන හඳුනාගත හැකිය. මෙහි ''රුප'' වදන ''රූප්‍ය'' යන සංස්කෘත වදනින් බිඳී ආ එකක් බව පරණවිතාන කියයි. (ibid:xciv) එවිට ''රුපදක'' වශයෙන් යෙදෙනුයේ ''රූපාධ්‍යක්ෂ'' යන අර්ථයෙනි. මෙහි ''රූප'' යනු ''මිල මුදල්'' යන අදහස ඇති බැවින් මුදල් පිළිබඳ අධ්‍යක්ෂක යන අදහස එම වදනේ ඇති බව නිගමනය කළ හැකිය. මෙම ශිලා ලේඛනයේ මුදල් පරිහරණය කරන්නා ගෘහපති යන නිලය ද දැරූ තිස්ස නම් වන අයෙකි. (ibid:73) එයින් පැහැදිලි වන්නේ රජුගේ බලපරාක්‍රමය යටතේ මුදල් නිෂ්පාදනය කළ නිලධාරියා ''රුපදක'' වශයෙන් හඳුන්වා ඇති බව යි. ආර්ථික තත්ත්වය පිළිබඳව කෙරෙන විමර්ශනයේදී රූපාධ්‍යක්ෂකගේ වටිනාකම වැඩි වනුයේ රටේ මුදල් නිර්මාණය හෝ මුදල්වල නිල භාරකාරත්වය දරන නිලධරයා ඔහු වන බැවිනි.

මේ හැර මෙම යුගයේ ''නකතික'' යනුවෙන් ද වදනක් ශිලා ලේඛනවල අන්තර්ගත වේ. ''නකතික'' යන වදන ''නැකැත්කරු, නැකැත් කියන්නා'' යන අර්ථවල යෙදේ. අතීතයේ සිටම නැකත් බැලීම හා නැකත් අනුව වැඩ කටයුතු කිරීම විශේෂ වශයෙන් සුභ කටයුතුවල යෙදීම මෙරට සිරිතක් වශයෙන් පැවැති බව වංසකථාවන්ගෙන් ද සනාථ වේ. පණ්ඩුකාභය රජුගේ රාජ්‍ය පද ප්‍රාප්තිය පිළිබඳ විස්තරයේ දී ''අනුර'' නැකතින් නුවර ඉදිකළ බව කියවේ. (ම.ව.10:77) තව ද බෝධිරෝපණ උත්සවය පිළිබඳ විස්තරයේ දී ''රෙහෙණ'' නැකතින් එය කළ බව සටහන් වේ. (ම.ව.19:44) මෙලෙස නැකැත් හා ඒවා විශ්වාස කිරීම පිළිබඳ වංශකථාගත පුවත් මහින්දාගමනයට පෙරාතුව ද ඉන් පසුව ද යන අවස්ථා දෙකේදී ම දැකිය හැකි වේ. ශිලාලේඛන අතරත පෙරියකඩු විහාර ශිලාලේඛනයක පරුමක අභිධානය දැරූ ''නකතික'' කෙනෙක් පිළිබඳව කියැවේ. (Paranavitana S.,1970:73) නක්ෂත්‍ර පිළිබඳ මෙරට ජනයා අතරත පැවති විශ්වාසය මහින්දාග මනයටත් පෙර සිට ම පැවති බව පසක් වේ. පණ්ඩුකාභය රජු තනතුරු ප්‍රදානය කිරීමේදී පණ්ඩුල නම් බ්‍රාහ්මණයාගේ පුත් චන්ද්‍ර නම් බමුණු තෙම අග්‍රපුරෝහිත ලෙස නම් කිරීමෙන් ම ඒ බව සනාථ වේ. (ම.ව.10:79) නකතික යන වචනය සංස්කෘත භාෂාවේ නක්ෂත්‍රික යන වචනයෙන් ද (සං.සිං.ශ,2004,401) පාලි භාෂාවෙන් නක්ඛත්තික (පා.සිං.අ,1998:255) යන වදනින් බිඳී ආ බව සිතිය හැකිය. කෙසේ වෙතත් නක්ෂත්‍ර පාඨකයන් මූල බ්‍රාහ්මී ශිලාලේඛන අවධියේ වාසය කළ බවත්, ඔවුන් නැකැත් කීම හා සුභ මුහුර්ථ සෑදීම සිදු කළ බවත් වංශකථා සාධක විමර්ශනය කොට බැලීමේදී පැහැදිලි කර ගත හැකි ය. ''නකතික'' යන වදන මූල බ්‍රාහ්මී ශිලාලේඛනවල යෙදී ඇත්තේ එක් වතාවක් පමණි.

මූල බ්‍රාහ්මී ශිලාලේඛන අවධියේ මෙරට පැවැති ආර්ථික තත්ත්වය පිළිබඳ විමර්ශනය කිරීමේදී වැදගත් තවත් වදනක් ලෙසට ''මණිකර'' යන වචනය හඳුන්වාදිය හැකිය. ''මණිකර'' යන වදනට පරණවිතාන අර්ථ දක්වා ඇත්තේ මැණික් කපන්නා, පබලු නිෂ්පාදකයා, මැණික් කපා ඔප දමන්නා යන අර්ථයෙනි. (Paranavitana S.,1970:117) මෙම යුගයේ මෙරට විවිධ පාෂාණ හා මැටි පබළු හමු වන අවස්ථා ඇති අතර ඒ පිළිබඳ වාර්තා පර්යේෂණ වාර්තාවන්හි බෙහෙවින් තිබේ. ආර්ථික වශයෙන් ගෙන බැලීමේදි

මැණික් ආශ්‍රිත නිෂ්පාදන ප්‍රධාන වශයෙන් යම් සමාජයක ධනවත් භාවය ප්‍රකට කරන සාධකයක් වශයෙන් හඳුනාගත හැකි ය. මූල බ්‍රාහ්මී ශිලාලේඛන අතර අවස්ථා හතක දී (07) ''මණිකර'' යන වදන සටහන් වී ඇති ආකාරය පරීක්ෂණය කළ හැකිය. මිහින්තලයේ ආනෛයිකුට්ටිකන්ද ශිලාලේඛනයකින් ''මණිකර මුලගුතහ පදගඩිනි'' වශයෙන් යෙදී ඇත. (ibid:06) මැණික්කරු මූලගුප්තගේ පාෂාණ ඵලකය වශයෙන් එය නූතන සිංහල භාෂාවට නැගිය හැකිය. පනික්කන්කුලමෙන් ලද ශිලා ලිපියක ''මණිකර චුඩහ දුවෙ'' වශයෙන් යෙදී ඇත. එම ශිලා ලේඛනයට පෙර එම ස්ථානයේ ම ශිලා ඵළක පිදූ තවත් ලිපියක් වේ. මේ නිසා මෙහි අර්ථය මැණික්කරු චුඩගේ ශිලා ඵළක දෙක වශයෙන් අර්ථ දැක්විය හැකිය. (ibid:176) තව ද තෝනිගල ලිපියක ''ගපති මණිකර තිශහ ලෙණෙ'' වශයෙන් යෙදී තිබේ. ඒ අනුව එම මැණික්කරු ගෘහපතියෙක් ලෙස ද සමාජයේ වැදගත් ආර්ථික තත්ත්වයක් හිමිව සිටි අයෙකු වශයෙන් ද එම ලිපියේ සඳහන් ගපති, මණිකර තිස්ස හඳුනාගත හැකිය. (ibid:42) මාම්පිට විහාර ශිලාලේඛනයක සටහන්ව ඇත්තේ ''අඩිකය උතරහ දුවෙ කහපණ මණිකර පුශ'' වශයෙනි. එයින් මණිකර කෙනෙක් පිළිබඳව කියැවෙන අතර මැණික්කරු උත්තරගේ කහවණු දෙක හා මැණික්කරු පුස්සගේ වශයෙන් යෙදී තිබේ. එම ශිලාලේඛනයේ කොටසක් කැඩී ගොස් ඇති බැවින් එහි සමස්ත අර්ථය වටහා ගත නොහැකිව පවතී. (ibid:60) තව ද වේගිරි දේවාලයෙන් සොයාගත් ලෙන් ලිපියක ලෙණ පිදීම සඳහා දායක වූවන් අතර මැණික්කරු දත්ත ද සම දායකත්වයක් දැක්වූවන් අතර මැණික්කරු චූඩ ද වේ. (ibid:62) මෙහි ලෙන් පූජාවන් සිදු කොට ඇත්තේ පුද්ගලයින් නව දෙනෙකුගේ දායකත්වයෙනි. ඒ අතර ද මැණික්කරුවන් දෙදෙනෙක් ද එසේ ම දෙමඩඹයෙන් සොයාගත් ඉතා වැදගත් සිද්ධියක් සටහන් වන ශිලාලේඛනයක මචූඩි රජ හෙවත් මහා චූලික මහා තිස්සරජුගේ (ක්‍රි. පූ. 77-63) මැණික්කරු ශිලා ඵලක සෑදීම සඳහා පැමිණි බවත් ඔවුන් මරු තුරුලට ගිය බවත් එහි සටහන්ව තිබේ. (ibid:64) ''මචුඩි රජශ මණිකරශෙ ශිල ඉටක කටය අගතසෙ (මචු) ගතසෙ'' වශයෙන් එහි යෙදී තිබේ. මචූඩි රජුගේ මැණික්කරුවන් ගල් ගඩොල් සෑදීම සඳහා පැමිණි බවත් ඔවුන් මරණයට පත්වූ බවත් එයින් කියවේ. මේ හැරුණු විට ගල්ගමුවෙන් ලද කැඩී ගිය ශිලාලේඛනයක ''මණිකර නගහ'' වශයෙන් මැණික්කාර නාග කෙනෙක් පිළිබඳව කියැවේ.

මෙලෙස මෙම යුගයේ ශිලාලේඛන අතරත මැණික් කැපීම, ඔප දැමීම හා වෙළඳාම සම්බන්ධයෙන් ප්‍රගුණ කළ මැණික් කරුවන් සිටි බව සනාථ වේ. මේ අනුව තත් තත්කාලීන ආර්ථිකයෙන් ධනවත් හා බලවත් පුද්ගලයින් සතුව මැණික් කරමාන්තය ප්‍රගුණ කළ ශිල්පීන් වාසය කළ බව නිගමනය කළ හැකිය.

වෙළෙන්දා යන අර්ථය සහිතව වණිජ, වණිඣ යන වදන් මෙම යුගයේ ශිලාලේඛන අතරත ඉඳහිට දක්නට ලැබේ. ඒ අතරත ''වණිජ'' යන වදන යෙදුණු ශිලාලේඛන දෙකක් ද (02) ''වණිඣ'' වශයෙන් යෙදුණු ශිලාලේඛන තුනක් ද (03) සොයාගෙන තිබේ. වාණිජ යන වදන වෙළෙන්දා, වෙළඳාම යන අර්ථයෙන් යෙදේ. මණ්ඩාගලින් හමුවූ ශිලාලේඛන දෙකක ම ''වණිජ ශුමනහ ලෙණෙ'' වශයෙන් යෙදී තිබේ. (Paranavitana,S1970:45) පෙරියපුලියන්කුලම ශිලාලේඛනයක ''දමෙඩ වණිඣ ගපති විශකහ'' වශයෙන් යෙදී ඇත. එහි දැක්වෙන ආකාරයට විශක නම් වෙළෙන්දා ද්‍රවිඩ පුද්ගලයෙකි. තව ද ඔහු ගපති හෙවත් ගෘහපතියෙක් ද වෙයි. (ibid:64) එහි ම ඇති තවත් ශිලා ලේඛනයක පඩිපෙළක පඩි පූජා කිරීමක් පිළිබඳව කියවේ. එම පඩි ද ''විශක'' විසින් ම පුදා ඇත. මුලින් දැක් වූ ශිලාලේඛනයට අමතරව මෙම ශිලා ලේඛණයේ දක්වා ඇත්තේ ලෙන පූජා කිරීම වෙනුවට පඩිපෙළ පූජා කිරීමයි. වෙළෙන්දන් පිළිබඳ සාධක මෙම යුගයේ වෙළඳාම පිළිබඳ අධ්‍යයනයට මහත් සේ උපකාරී වේ. කුඩුවිල්වලින් ලද තවත් වටිනා ශිලා ලේඛනයක වෙළෙන්දන් පිළිබඳව ලියැවෙන අතර එකී වෙළෙන්දන්ගේ වාසස්ථානයන් පිළිබඳව ද කරුණු සඳහන් කොට ඇත. ඒ අනුව ''දිගවපි පොරණ වණිඣහ'' වශයෙන් එහි යෙදී තිබේ. දීඝවාපියේ පුරාණ වෙළෙන්දන් විසින් මෙම ලෙන් පූජාව කළ බවත් ''දමෙඩ තිශය ලෙණෙ'' වශයෙන් යෙදී ඇති බැවින් ද්‍රවිඩ තිස්සගේ ලෙණ වශයෙන් හඳුන්වා තිබීමෙන් මෙම වෙළෙන්දන් බෞද්ධයන් වශයෙන් හඳුනා ගැනීමට අවකාශ සලසයි. (ibid:37)

මෙම යුගයේ ආර්ථික තත්ත්වය පිළිබඳව ඍජු සාධක හමු නොවෙතත් මෙම තොරතුරුවලින් ආර්ථිකය හා එය තහවුරුවන ලද විවිධ පුද්ගලයන් හා තත් සමාජයේ ප්‍රභූන් පිළිබඳව හඳුනා ගැනීමට මෙම තොරතුරු උපකාර වන බව සඳහන් කළ හැකිය.

හැළි වළං සෑදූ පුද්ගලයන් ද සමාජ යාන්ත්‍රණයෙහි ප්‍රධාන කර්මාන්තකාර පිරිසක් බව මෙම යුගයේ ආර්ථික තත්ත්වය විමර්ශනයේදී හඳුනාගත හැකිය. ආහාර සකස් කර ගැනීම හා ගබඩා උපකරණ වශයෙන් භාවිතයට ගැනීම සඳහා හැළි වළං සෑදීම එම යුගයේ ප්‍රධාන අංගයක් වශයෙන් පැවති බව සිතිය හැකිය. ''කබරක'' යන වදන පරණවිතාන අර්ථ ගන්වා ඇත්තේ ''කුම්භකාර'' හෙවත් හැළි වළං සාදන්නා යන අර්ථයෙනි. (Paranavitana,S.,1970:45) එසේ ම මෙම ශිලා ලිපියේ ''දටික'' යන වදන අර්ථ ගන්වා ඇත්තේ ''දාටික'' වශයෙන් මාතෘ භාෂාවල යෙදෙන වදනෙහි අර්ථය පදනම් කරගෙන යි. ඒ අනුව එයින් ඇත්දත් ආශ්‍රිත නිර්මාණ කරන්නා යන අර්ථය මතුව එයි. (ibid:37) එසේ ගත් විට ඇත්දත් කර්මාන්තය ද මෙම යුගයේ සුළු කර්මාන්ත වශයෙන් බෙහෙවින් ජනප්‍රියව පැවති බව පසක් වේ. මෙරට වෙළඳාම සම්බන්ධ සාකච්ඡාවේදී ඇත්දත් වෙළඳාම අතීතයේ ප්‍රමුඛ මට්ටමේ වෙළඳාමක් වශයෙන් පැවැති බවට සාධක පවතී. ඒ අනුව වළං කර්මාන්තකරුවන් හා ඇත්දත් කර්මාන්තකරුවන් ද මෙම කාල පරිච්ඡේදය තුළ මෙරට ප්‍රධාන ධනෝපායන මාර්ග වශයෙන් ක්‍රියාත්මක වූ බව සිතිය හැකි ය. මූල බ්‍රාහ්මී අභිලේඛනවලින් හමුවන ආර්ථික තත්ත්වය පිළිබඳ විමර්ශනයේ දී ප්‍රකට වනුයේ යම් සීමිත තොරතුරු ප්‍රමාණයක් පමණක් මෙකී ශිලා ලේඛනවලින් දැනගත හැකි වෙයි. එසේ ම එකී තොරතුරු ද හුදු ආර්ථිකය හා සම්බන්ධ තොරතුරු දැක්වීමේ අදහසින් ඉදිරිපත් නොකරන ලද ඒවා වන අතර වෙනත් තොරතුරුවලින් පීරාගෙන ආර්ථික තත්ත්වයන් විමර්ශනයට මග පෑදෙන බව ද ප්‍රකට වේ.

**නිගමනය**

මූල බ්‍රාහ්මී ශිලාලේඛන ආශ්‍රයෙන් ප්‍රකට වන්නේ මේ යුගයේ ශ්‍රී ලාංකේය ආර්ථික තත්ත්වය ප්‍රධාන වශයෙන් කෘෂිකර්මාන්තය මත රඳා පැවති බව යි. එසේ ම දේශිය හා ජාත්‍යන්තර වෙළඳාම ද භාණ්ඩ හුවමාරු ක්‍රමය ද මේ යුගයේ ක්‍රියාත්මකව පැවති බව සනාථ වේ. එසේ ම රාජ්‍යානුග්‍රහයෙන් බදු එකතු කිරීමේ ක්‍රමවේදයක් ද පැවති අතර ආර්ථිකය හැසිරවීමේ ප්‍රධාන බලය මහරජු වෙත කේන්ද්‍රගතව පැවති බවත්, ප්‍රාදේශීය පාලකයන් හා ගම් ප්‍රධානීන් මගින් එය සමස්ත රටෙහි ම ක්‍රියාත්මක කිරීමට මහරජු ක්‍රියා කළ බවත්

ප්‍රකට වේ. ආර්ථිකය සම්බන්ධ විවිධ නිලයන් ක්‍රියාත්මකව පැවති අතර ඒ සියල්ලක් ම ප්‍රභුත්වය හා පාරම්පරික උරුමය මත ක්‍රියාත්මක වූ බවත්, පිළිගත් පාලන සංවිධානයක් ක්‍රියාත්මකව පැවති බවත් ප්‍රකට වේ. මේ අනුව ශ්‍රී ලංකාවේ මේ යුගයේ විධිමත් ආර්ථික පාලන ක්‍රමවේදයක් ද ක්‍රියාත්මකව පැවති බව සනාථ වේ.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය


01 අලගියවන්න පී, 2004, සංස්කෘත සිංහල ශබ්ද කෝෂය, සූරිය ප්‍රකාශකයෝ, කොළඹ

02 Karunarathna S., 1984, Epigraphia Zeylanica, Volume VII, Archaeological Department of Ceylon, Colombo.

03 Dias Malini, 2001, The Groth of Buddhist Monastic Institutions in Sri Lanka from Brahmi Inscriptions, Epigraphia Zeylanica, Volume VIII, Published by the Department of Archaeological Survey, Govirnment of Sri Lanka

04 නිකොලස් සි.ඩබ්. 1967, සිංහල රජුන්ගේ විරුදාවලී, ලංකා ඉතිහාසය 1 කාණ්ඩය, සාහිත්‍ය මණ්ඩලීය ලිපිමාලා අංක 01, ශ්‍රී ලංකා සාහිත්‍ය මණ්ඩලය, කොළඹ.

05 Paranavitana S., 1970, Inscriptions of Ceylon, Volume I, Published by the Department of Archaeology, Sri Lanka

06 Paranavitana S., 1933, Kataragama Inscription, Epigraphia Zeylanica, Volume III, Published for the Govirnment of Ceylon by the Henry Frowde Oxford University Press, Amen Corner, E.C.

07 Perera Laksman S., 2001, The Institutions of Ancient Ceylon from Inscriptions, Volume I, University of Peradeniya, Sri Lanka

08 බුද්ධදත්ත හිමි පී. 1998, පාලි සිංහල අකාරාදිය, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, නැදිමාල, දෙහිවල

09 Majumdar, R.C., 1922, Corporate Life in Ancient India, The Oriental Book Agency, Poona

10 මහාවංසය, සිංහල පරිවර්තනය, 2012, හික්කඩුවේ ශ්‍රී සුමංගල බටුවන්තුඩාව සිංහල පරිවර්තනය, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, නැදිමාල, දෙහිවල

11 මේධානන්ද හිමි එල්ලාවල, 1999, අප්‍රකට බ්‍රාහ්මී ලෙන් ලිපි, සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව, කොළඹ.

12 Rapson E.J., 1922, The Cambridge History of India, Volume I, Cambridge University Press, London.

13 විමලබන්ති හිමි ජී, 2018, ශිලාලේඛන, මල්වතුඔය නිම්නයේ ඌත්තුවෙල්ලිය සහ කොන්ග්‍රායන්කුලම් පුරාවිද්‍යා ස්ථාන හා ස්මාරක, ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය, අනුරාධපුර

14 Wickremasinghe D.M.De Z., 1912, Epigraphia Zeylanica, Volume I, Published for the Govirnment of Ceylon by the Henry Frowde Oxford University Press, Amen Corner, E.C.

15 සිරිසෝම ඇම්.එච්. අමරසිංහ ගීතා, 1986, හස් එබූ කහාපණ, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, කොළඹ